# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2220/36 - 2021 මාර්තු මස 23 වැනි අඟහරුවාදා - 2021.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 12,14 සහ 22 වැනි වගන්ති සමඟ කියවිය යුතු 32 වන වගන්තියෙන් මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 දෙසැම්බර් මස 03 දිනැති අංක 2152/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ, සුරාබදු නිවේදනය අංක 08/2019 ලෙස ප්‍රකාශයට පත් කරන ලද නියමය 2020 සැප්තැම්බර් මස 10 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

*එස්. ආර්. ආටිගල,*
*ලේකම්,*
*මුදල් අමාත්‍යාංශය.*

2021 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

නියමය

1. තීරුබදු රහිත සාප්පුවල විදේශ ව්‍යවහාර මුදලට විකිණීම සඳහා ආනයනය කරනු ලබන හෝ ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරනු ලබන විදේශ මත්පැන් හැර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම විදේශ මත්පැන් තොග ලීටරයක් සඳහා පහත උපලේඛනයේ සඳහන් කර ඇති අනුපාත පරිදි සුරා බද්දක් අයකළ යුතු ය.

*උපලේඛනය*

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | ප්‍රමාණ ඒකක | *ICL/ SLSI* | සුරාබද්ද (තොග ලීටරයට රු.) |
|---|---|---|---|---|---|---|
| 22.03 | | | මෝල්ට් වලින් නිෂ්පාදනය කළ බීර | | | |
| | 22.03.00.10 | --- | මිලිලීටර් 350ට වඩා අඩු කෑන් බියර් | ලීටර | | 135.00 |
| | 22.03.00.20 | --- | මිලිලීටර් 350 ක් හෝ ඊට වැඩි කෑන් බියර් | ලීටර | | 135.00 |
| | 22.03.00.90 | --- | අනෙකුත් | ලීටර | | 135.00 |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | ප්‍රමාණ ඒකක | ICL/ SLSI | සුරාබද්ද (තොග ලීටරයට රු.) |
|---|---|---|---|---|---|---|
| 22.04 | | | සුරක්ෂිත කළ වයින් ඇතුළු අලුත් මිදි වලින් නිෂ්පාදනය කළ වයින්, ශීර්ෂ 20.09 යටතේ ඇති ඒවාට අමතර වූ අළුත් මිදි යුෂ. | | | |
| | 22.04.10.00 | - | ස්පාක්ලින් වයින් | ලීටර | | 230.00 |
| | | - | අනෙකුත් වයින් : මධ්‍යසාරය එකතු කිරීමෙන් පැසවීම නැවැත්වූ හෝ වැලැක්වූ අලුත් මිදි යුෂ : | | | |
| | 22.04.21.00 | - - | ලීටර් 2 ක් හෝ එයට අඩු ප්‍රමාණයක් අඩංගු භාජන තුළ බහාලු | ලීටර | | 230.00 |
| | 22.04.22.00 | - - | ලීටර් 2 කට වැඩි නමුත් ලීටර් 10 ට නොවැඩි ප්‍රමාණයක් අඩංගු භාජන තුළ බහාලු | ලීටර | | 230.00 |
| | 22.04.29.00 | - - | අනෙකුත් | ලීටර | | 230.00 |
| | 22.04.30.00 | - | අනෙකුත් අලුත් මිදි යුෂ | | | 230.00 |
| 22.05 | | | පැලෑටි වලින් හෝ සුවඳ සාරක වලින් රස කරන ලද අලුත් මිදි යුෂයෙන් නිෂ්පාදනය කළ වර්මත් හා අනෙකුත් වයින් වර්ග | ලීටර | | |
| | 22.05.10.00 | - | ලීටර් 2 ක් හෝ ඊට අඩු ප්‍රමාණයෙන් අඩංගු භාජනය තුළ බහාලූ | ලීටර | | 230.00 |
| | 22.05.90.00 | - | අනෙකුත් | ලීටර | | 230.00 |
| 22.06 | 2206.00.00 | | පැසවූ අනෙකුත් පාන වර්ග (උදාහරණ වශයෙන් සයිඩර්, පෙරී, මීඩ්.සකේ) ; පැසවූ පාන වර්ග වල මිශ්‍රණයන් සහ අන් තැනක නිශ්චිත ලෙස සඳහන් නොවූ හෝ ඇතුළත් නොකළ, අමද්‍යප පාන වර්ග සහ පැසවූ පාන වර්ග වල මිශ්‍රණයන්. | | | |
| | 22.06.00.10 | ---- | අමද්‍යප පාන වර්ග | ලීටර | | 650.00 |
| | 22.06.00.90 | ---- | අනෙකුත් | ලීටර | | 230.00 |
| 22.08 | | | පරිමාව අනුව මධ්‍යසාර සැර ප්‍රමාණයෙන් 80% කට අඩු මධ්‍යසාර ප්‍රමාණයකින් යුත් (විප්‍රකෘති නොකළ) ඊතයිල් මධ්‍යසාර : ස්ප්‍රීතු වර්ග සහ අනෙකුත් ස්ප්‍රීතුමය පාන වර්ග. | | | |
| | 22.08.20.00 | - | ආසුත වයින් හෝ මිදි පෙරීමෙන් ලබා ගන්නා ස්ප්‍රීතු වර්ග | ලීටර | | 650.00 |
| | 22.08.30.00 | - | විස්කි | ලීටර | | 650.00 |
| | | - | රම් සහ පැසවූ උක් නිෂ්පාදිත ආසවනයෙන් ලබාගත් අනෙකුත් ස්ප්‍රීතු වර්ග | | | |
| | 22.08.40.10 | --- | රම් | ලීටර | | 650.00 |
| | 22.08.40.90 | --- | අනෙකුත් | ලීටර | | 650.00 |
| | 22.08.50.00 | - | ජින් සහ ජිනීවා | ලීටර | | 600.00 |
| | 22.08.60.00 | - | වොඩ්කා | ලීටර | | 600.00 |
| | 22.08.70.00 | - | ලිකියර් සහ කෝඩියල් | ලීටර | | 600.00 |
| | 22.08.90.00 | - | අනෙකුත් : | | | |
| | 22.08.90.10 | --- | පොල් අරක්කු | ලීටර | | 600.00 |
| | 22.08.90.90 | --- | අනෙකුත් | ලීටර | | 650.00 |

2. විදේශ මත්පැන් ආනයනය කිරීම සඳහා මෙහි I වන උපලේඛනයේ දක්වෙන අයදුම් පත්‍රයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මෙහි II වන උපලේඛනයේ දක්වෙන ආනයන අවසර පත්‍රයක් නිකුත් කළ හැකි ය.

3. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්නොවන්නේ නම් එම අයදුම්පත්‍රය ලැබී දින පහක් ඇතුලත එය ප්‍රතික්ෂේප කිරීමට හේතු සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අයදුම්කරු වෙත දැන්විය යුතුය.

4. විදේශ මත්පැන් ආනයනය කිරීම සඳහා II වැනි උපලේඛනයේ වූ ආනයන අවසර පත්‍රයක් නොමැතිව කිසිදු මත්පැනක් ආනයනය නොකළ යුතු ය.

5. ආනයන අවසර පත්‍රයක් නොමැතිව ශ්‍රී ලංකාවට විදේශ මත්පැන් ආනයනය කරනු ලැබුවහොත් ඉහත බද්දට අමතරව මි.ර.ගැ. (CIF) වටිනාකම මත 3% අධිභාරයක් අය කිරීමට හෝ ආනයනය කරනු ලබන විදේශ මත්පැන් තොගය රාජසන්තක කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ට හැකිය.

6. විදේශ මත්පැන් තොගයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ විටදී ඒ පිළිබඳව මෙහි III වැනි උපලේඛනයේ දැක්වෙන ආකෘතියේ වූ රේගු සහතිකය බලයලත් රේගු නිලධාරියෙකු විසින් සහතික කර සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

7. III වැනි උපලේඛනයේ සඳහන් රේගු සහතිකය සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, ආනයනික විදේශ මත්පැන් තොගය මුදා හැරීම සඳහා මෙහි IV, V වැනි උප ලේඛනයන්හි සඳහන් ප්‍රවාහන අවසර පත්‍රය හා ආනයනික විදේශ මත්පැන් සඳහා සුරාබදු ගෙවූ බවට සහතික නිකුත් කළ යුතු ය. ප්‍රවාහන අවසර පත්‍රය, ආනයනික අවසරපත්‍රය සහ ආනයනික විදේශ මත්පැන් සඳහා සුරාබදු ගෙවූ බවට ලේඛන නොමැතිව ශ්‍රී ලංකා රේගුවෙන් මත්පැන් නිදහස් නොකළ යුතු ය.

8. රට තුළට මත්පැන් ආනයනය කිරීමේදී රස පරීක්ෂක වාර්තාවක් (ප්‍රමිතිය හා සැර පිළිබඳව) ඉදිරිපත් කළ යුතු ය. රස පරීක්ෂක වාර්තාව රජයේ රස පරීක්ෂක මගින් ඉදිරිපත් කළ යුතු ය. සුරාබදු කොමසාරිස් ජනරාල් රස පරීක්ෂක වාර්තා ලබා ගැනීම සඳහා නිදර්ශක වශයෙන් මත්පැන් ආනයනය කිරීමට අවසරපත්‍ර ලබා දිය හැක. එසේ මත්පැන් ආනයනයකදී මත්පැන්වල ප්‍රමිතිය සහ සැර පිළිබඳ සම්පූර්ණ වගකීම ආනයනකරු දැරිය යුතු ය. රස පරීක්ෂක වාර්තා කැඳවීම සම්බන්ධයෙන් වූ නිර්ණායක සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පැනවිය හැකි ය.

9. සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මත්පැන් ආනයනය සඳහා වූ අවසර පත්‍රය ඒ සඳහා බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලූ විටදී ඉදිරිපත් කළ යුතු ය. විදේශ මත්පැන් ආනයන සඳහා වූ අවසර පත්‍රය හා ප්‍රවාහන අවසර පත්‍රය හා ආනයනික විදේශ මත්පැන් සඳහා බදු ගෙවූ බවට සහතිකය සුරාබදු තොග වෙළඳ බලපත්‍ර ස්ථානයේ (ර.බී.3) ගොනු කර තිබිය යුතු ය.

10. ශ්‍රී ලංකාවට ආනයනය කළ මත්පැන් ප්‍රති අපනයනය කිරීමේදී ඉහත 1 වන වගන්තිය යටතේ අය කරන ලද ආනයන මත්පැන් බද්ද ආපසු ප්‍රතිපූර්ණය කළ හැකිය. එසේ ප්‍රතිපූර්ණ ලබාගැනීම සඳහා මෙහි පහත දක්වා ඇති ලේඛන සමග මත්පැන් ප්‍රති අපනයනය කළ දින සිට දින 30 ඇතුළත සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලුම් කළ යුතු ය.

i. මත්පැන් ආනයනයට ලබා දුන් සුරාබදු ආනයනය අවසර පත්‍රය
ii. සුරාබදු ගෙවූ රිසිට් පත්‍රය
iii. ආනයනික විදේශ මත්පැන් සඳහා සුරාබදු ගෙවූ බවට සහතිකය
iv. නෞභාර පත්‍රය හෝ ගගන මාර්ග පත්‍රය
v. අපනයනය කළ මත්පැන් සඳහා ඉන්වොයිසිය
vi. රේගු අපනයන පත්‍රය

11. 2019 මාර්තු 05 දිනැති අංක 2113/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 02/2019 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

අයදුම්පත් අංකය :...........................

*I වන උපලේඛනය*

**මත්පැන් ආනයනය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම -
2. ජාතික හැඳුනුම්පත් අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය -
3. දුරකථන අංකය -
4. විද්‍යුත් තැපැල් ලිපිනය -
5. අයදුම්කරුගේ ව්‍යාපාරික ලිපිනය -
6. බදු ගෙවන්නා හඳුනාගනීමේ (TIN) අංකය -
7. සුරාබදු බලපත්‍රය (ර.බි.3) ක්‍රියාත්මක ස්ථානයේ නම හා ලිපිනය -
8. (i) මත්පැන් නිෂ්පාදනය කළ රට -

   (ii) මත්පැන් ආනයනය කිරීමට බලාපොරොත්තු වන රට -

   (iii) නාම මාත්‍ර ඉන්වොයිසියේ අංකය හා දිනය :-

   (iv) වලංගු කාලය :-

   (නාම මාත්‍ර ඉන්වොයිසිය මේ සමඟ ඇමිණිය යුතුය)
9. ආනයනය කරනු ලබන මත්පැන් ලීටර ප්‍රමාණය

   ධාන්‍ය මත්පැන් හෙවත් බියර් -

   වයින් -

   අනෙකුත් විදේශ මත්පැන් -
10. මත්පැන් ආනයනය කිරීමට බලාපොරොත්තු වන දිනය -
11. වෙනත් කරුණු -

දිනය :........................... .........................................

අයදුම්කරුගේ අත්සන.

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි*

(ප්‍රතික්ෂේප කිරීමට හේතු/විශේෂ කොන්දේසි) ........................................................................................................................ මත්පැන් ආනයනය සඳහා අවසර දෙමි/අවසර නොදෙමි/ඉහත කොන්දේසි වලට යටත්ව අවසර දෙමි.

.......................................

දිනය ......................................... සුරාබදු කොමසාරිස් ජනරාල්.

*II වන උපලේඛනය*

***ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව***

**මත්පැන් ආනයනය කිරීම සඳහා වූ අවසර පත්‍රය**

1. බලපත්‍රකරුගේ නම :-
2. ව්‍යාපාර ලියාපදිංචි අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය :-
3. ව්‍යාපාරික ලිපිනය :-
4. බදු ගෙවන්නා හඳුනාගනීමේ (TIN) අංකය :-
5. අයදුම්පත්‍ර අංකය :-

6. මත්පැන් ආනයන බලපත්‍ර අංකය :-
   (i) නාම මාත්‍ර ඉන්වොයිස් අංකය හා දිනය :-
   (ii) වලංගු කාලය :-
   (iii) මත්පැන් ආනයනය කරනු ලබන රට :-

7. මත්පැන් වර්ගය හා ලීටර ප්‍රමාණය -
   ධාන්‍ය මත්පැන් හෙවත් බියර් -
   වයින් -
   අනෙකුත් විදේශ මත්පැන් -

8. ආනයන බලපත්‍රය වලංගු කාලසීමාව :- ............................................ දින සිට ............................................ දක්වා
9. වෙනත් කරුණු :-

මෙම අවසරය මත්පැන් රට තුළට ආනයන සඳහා පමණක් වන අතර සුරාබදු මුදල් ගෙවන තෙක් මෙම අවසර පත්‍රය යටතේ රේගුවෙන් ආනයනික මත්පැන් නිකුත් නොකළ යුතු ය.

ඉහත කොන්දේසියට යටත්ව මෙහි සඳහන් මත්පැන් තොගය ආනයනය කිරීමට අනුමත කරමි.

..................................
සුරාබදු කොමසාරිස්.

දිනය :...........................

*III වන උපලේඛනය*

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන සුරාබදු කාර්යාලය,
කොළඹ.

**රේගු සහතිකය**

සුරාබදු දෙපාර්තමේන්තුවේ අංක ............................................................ දරන මත්පැන් ආනයන බලපත්‍ර යටතේ ................................................................ දරන ලිපිනයේ පදිංචි ............................................................................................ (බලපත්‍රධාරියාගේ නම) විසින් මෙරටට ආනයනය කරන ලද පහත සඳහන් මත්පැන් ප්‍රමාණය ශ්‍රී ලංකා රේගුවට ලැබී ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

1. බහාලුම් අංකය :-
2. මත්පැන් තොග ලීටර් ප්‍රමාණය :-
   - ධාන්‍ය මත්පැන් හෙවත් බියර් -
   - වයින් -
   - අනෙකුත් විදේශ මත්පැන් -
3. රේගු සටහන්කරයේ අංකය හා දිනය :-
4. බදුගෙවන්නා හඳුනාගැනීමේ (TIN) අංකය
5. වෙනත් කරුණු :-

දිනය :............................

.............................................................
බලයලත් රේගු නිලධාරියාගේ අත්සන.

*IV වන උපලේඛනය*

**මත්පැන් ප්‍රවාහනය කිරීම සඳහා වූ අවසර පත්‍රය**

අවසරපත්‍ර අංකය :...........................

1. ආනයනකරුගේ නම :........................................................................................................................

2. ව්‍යාපාර ලියාපදිංචි අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය :......................................................................

3. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය :- ..........................................................................................................

4. මත්පැන් ආනයනය කිරීමට නිකුත් කළ සුරාබදු බලපත්‍රයේ අංකය :........................................................

5. මත්පැන් මෙරටට ආනයනය කල මාර්ගය (මුහුදු/ගුවන්) :..............................................................................

6.

| *මත්පැන් ප්‍රවාහනය කරන රථයේ අංකය හෝ බහාලුම් අංකය* | *රේගු සටහන්කරයේ අංකය හා දිනය* | *මත්පැන් වර්ගය* | *මත්පැන් තොග ලීටර් ප්‍රමාණය* |
|---|---|---|---|
| | | | |

7. මත්පැන් ගෙන යනු ලබන ස්ථානයේ නම හා ලිපිනය :-
8. මත්පැන් ප්‍රවාහනය කරනු ලබන මාර්ගය :-
9. ප්‍රවාහන අවසරපත්‍රයේ වලංගු කාල සීමාව :-
10. ආනයනික විදේශ මත්පැන් සඳහා සුරාබදු ගෙවූ බවට සහතිකයේ අංකය :-
11. වෙනත් කරුණු :-

ඉහත සඳහන් මත්පැන් තොගය ප්‍රවාහනය කිරීම සඳහා අවසර දෙමි.

.....................................
බලයලත් සුරාබදු නිලධාරී

දිනය ............................................

ප්‍රවාහන බලපත්‍රය භාරගත් තැනැත්තාගේ නම :- .......................................................................
ජාතික හැඳුනුම්පත් අංකය :- .......................................................................
අත්සන හා දිනය :- .......................................................................

*V වන උපලේඛනය*

**ආනයනික විදේශ මත්පැන් සඳහා සුරාබදු ගෙවූ බවට සහතිකය**

අංකය :-

ආනයනික බලපත්‍ර අංකය : .........................................................................................................

බලපත්‍රකරුගේ නම : .........................................................................................................

| *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක* | *වර්ගය හා ප්‍රමාණය (තොග ලීටර)* | *ගෙවූ බදු මුදල* | *රිසිට්පත් අංකය හා දිනය* |
|---|---|---|---|
| | i. ධාන්‍ය මත්පැන් හෙවත් බියර් ................................<br>ii. වයින් .........................................<br>iii. අනෙකුත් විදේශ මත්පැන් ........................................... | | |

රේගු සටහන්කරයේ අංකය හා දිනය :-

බහාලුම් අංකය :-

නෞභාර පත්‍රයේ හෝ ගගන පත්‍රයේ අංකය හා දිනය :-

ප්‍රවාහන අවසරපත්‍රයේ අංකය :-

.................................................

දිනය ........................................ බලයලත් සුරාබදු නිලධාරී අත්සන

04 - 530

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.